කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2013/14

2017 අප්‍රේල් - ජූනි

මානවශාස්ත්‍ර පීඨය

බෞද්ධ සංස්කෘතිය - **BUCU – E 2025**

බෞද්ධ සමාජ චින්තාව - පුද සිරිත් හා උත්සව

ප්‍රශ්න <u>පහකට</u> (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. පුද්ගල ස්වාමිත්වයට හානිකර වූ විවිධ ඉගැන්වීම් ගෙන හැර දක්වා ඒ පිළිබඳව බුදුසමය දක්වන ආකල්පය ප්‍රකට කරන්න.

02. සමාජානුයෝජනීය පුද්ගලයෙකු නිර්මාණය කිරීමෙහිලා සමාජානුයෝජන කාරකයන්ගෙන් ඉටුවන කාර්යභාරය බෞද්ධ දෘෂ්ටිකෝණයෙන් විමසුමට ලක්කරන්න.

03. බෝධිසත්ත්ව දර්ශනය ස්වාර්ථය මෙන්ම පරාර්ථ සාධනය පිණිස ඒකාබද්ධ වී ඇති අයුරු පරීක්ෂා කරන්න.

04. රාජ්‍යයෙහි ප්‍රභවය හා විකාසය පිළිබඳ බෞද්ධ චින්තාව සමාජ සුභ සාධනය මත පදනම් වූ බව මූලාශ්‍රයානුසාරයෙන් ප්‍රකට කරන්න.

05. නීතිය හා අපරාධය යනු කුමක් දැයි නිර්වචනය කොට අපරාධ මර්ධනය කිරීමෙහි ලා දඬුවම එකම විකල්පය නොවන බවට බුදු සමය දක්වන සාධක ගෙන හැර දක්වන්න.

06. නූතන සමාජගත ආර්ථික හා දේශපාලන ගැටලු නිරාකරණය කර ගැනීමෙහි ලා බුදුසමයෙන් ලද හැකි උපදේශනය මූලාශ්‍රයානුසාරයෙන් විභාග කරන්න.

07. ත්‍රිවිධ චෛත්‍ය හා බැඳුණු බෞද්ධ චාරිත්‍ර විධි කෙටියෙන් පැහැදිලි කොට ඒවායේ සංස්කෘතික හා ආගමික වටිනාකම් ප්‍රකට කරන්න.

08. පිරිත් සජ්ඣායනාවෙහි ඓතිහාසික පසුබිම විවරණය කරමින් පිරිතෙන් අපේක්ෂිත අරමුණු හා පරමාර්ථ පැහැදිලි කරන්න.

09. ආරාම කේන්ද්‍රීය පූජෝත්සව කිහිපයක් හඳුන්වා දෙමින් පුද්ගල සහජීවනයට ඒවායින් ලැබුණු ආලෝකය ප්‍රමාණ කරන්න.

10. ශාන්ති කර්ම ආදී අභිචාර විධි මඟින් බෞද්ධාගමික අදහස් ජනවිඥානයට සම්ප්‍රේෂණය කිරීමෙහි ලා දරා ඇති උත්සාහය මූලාශ්‍රයානුසාරයෙන් පෙන්වා දෙන්න.

*********************